# පොතක මහිම

(ග්‍රන්ථ විචාර සමුච්චය)




.4809
AN

ආචාර්ය සේන නානායක්කාර

250/2

99511 k

# පොතක මහිම

(ග්‍රන්ථ විචාර සමුච්චය)

RAJMNLIB
99511

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

## ආචාර්ය සේන නානායක්කාර

B.A. (Hons.), M.A. (Research), Ph.D. (Mass Comm.)

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

මිහින්තලේ

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 99511 |
| වර්ග අංකය | 891.4809 NAN |

සීමාසහිත

ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම

# පිවිසුම

"මම ජීවිතයේ අඳුරු පතුලේ සිට පැමිණියෙක් මි. මගේ හඬ ඒ අඳුරු පතුලේ දුගී දුකෙන් පෙළෙන මනුෂ්‍යයන් විසින් නගන ලද අඳෝනාවේ දෝංකාරය යි. මම ඔවුන් විඳින දුක ලෝකයාට කියාපෑම පිණිස ඔවුන් විසින් එවන ලද සාක්ෂිකරුවෙක් මි."

මේ මා කී දෙයක් නොව, රුසියානු මහා ලේඛක මැක්සිම් ගෝර්කි විසින් කියන ලද්ද කි. කිසිදා පාසල් අධ්‍යාපනයක් නොලද ඔහු, දුගී දුප්පත්කමේ පතුලට ත් යටින් හිඳ, සියලු දුක් අනුභව කරමින් ලෝක සත්තාව අවබෝධකොට ගත්තේ පොතපත කියැවීමෙනි. පසුකලෙක ඔහු ලෝකයට මග පෙන්වන කෘතහස්ත ලේඛකයෙකු වූයේ ත්, සාධාරණය වෙනුවෙන් පෙනී සිටින විප්ලවවාදියෙකු වූයේ ත්, පරාජය කළ නොහැකි චතුර කථිකයෙකු වූයේ ත්, එමෙන් ම ඒ සියලු සද්ගුණයන් සහිත පිරිපුන් මිනිසකු වූයේ ත්, පොත පතින් ලද අලෝකයෙනි.

ඉදින්, හොඳ පොතක් අපේ ජීවිත එළිය කරන්නක් යැයි කීම අතිශයෝක්තියක් නොවේ. සේකරගේ "ප්‍රබුද්ධ" කියවන්නට කියවන්නට මගේ ජීවිතය අලුත්වෙනු මට දැනෙයි. අපට ඉන් කියාදෙන යථාර්ථය දේශන සියයකින් හෝ ලැබිය නොහැකි ය. අප නොදකින ලෝක සත්තාව සේකර විනිවිද දකින අයුරු අපූරු ය. කිසියම් සාංසාරික පුරුද්දක් මෙන් අප ඊට සමීපවන්නට පටන් ගනී. කොන්ස්තන්තීන් පවුස්තවුස්කි The Golden Rose නම් කෘතිය සම්පාදනය කළේ මේ ලෝකය සුන්දර කරන්නට යැයි මට සිතේ. කලාකාර සිතක් තුළ කාටත් හොරා පිළිසිඳගන්නා කිසියම් චිත්තාවේගයක් ජන මනස පුබුදුවන පිරිපුන් කලා කෘතියක් බවට පත්වීම දක්වා ම ඔහු කරන වියමන රසපූර්ණ කවියක් සේ ය. සැබැවින් ම, එය කියැවීම අතිශය අපූරු සෞන්දර්ය චාරිකාවකට එක්වීමකැ යි මම හඟිමි.

මම ද පොත පත තුළින් ජීවිතය ලද්දෙක් මි. මෑත කාලය තුළ මා කියැවූ පොත් කිහිපයක් පිළිබඳ ව ලියන ලද අසම්පූර්ණ සටහන් කිහිපයක් මේ පොතට ගොනුකොට ඇත. කවි, ගී, කෙටිකතා, ආඛ්‍යාන කෘති හා තවත් ශාස්ත්‍රීය කෘති කිහිපයක් ද ඒ අතර වෙයි. ඒවා ප්‍රශස්ත විචාරධර්මානුකූල විග්‍රහයන් නොවේ. සරල රසාස්වාදය සහ සාධාරණ ශාස්ත්‍රීයභාව අපේක්ෂාකරන සාමාන්‍ය පාඨකයකු සඳහා සරිලන පරිදි ඉදිරිපත් කරන අදහස් සමුදාය කි. ඒවා කියැවීමෙන් පසු උක්ත කෘති පරිශීලනය කොට මා වෙත පුණ්‍යානු මෝදනා කළ සද්පුරුෂ පාඨකයෝ ද වෙති. නිස්සරණාධ්‍යාශයෙන් මා වැයකළ වෙහෙසට ඒ ප්‍රතිලාභය ම ප්‍රමාණවත් ය යන්න මගේ හැඟීම යි.

පාඨශාලීය හෝ විශ්වවිද්‍යාලයීය විෂයයන්හි ලා නිර්දිෂ්ට කෘති පිළිබඳ වූ විචාර සාහිත්‍යයක් ප්‍රකට වුව ද, අප රට තුළ සාමාන්‍ය පාඨකයා විෂයයෙහි ලා වන ග්‍රන්ථ විචාර සමුච්චයන් සම්පාදනය වීම විරල ය. මේ, ඒ සඳහා වන නුපුහුණු ඌන පූරණයක් කොට සලකමි. මෙය සම්ප්‍රදායක් බවට පත්වී ඉදිරියට යා නම් එය අපට ආස්වාදයක් වනු නිසැක ය.

මේ සඳහා ප්‍රස්තුත කොටගත් කෘති සම්පාදනය කළ ගිහිපැවිදි විද්වත් ලේඛක පරපුර හා කලාකාර නිර්මාණ ශිල්පීන් ගෞරව බහුමානයෙන් ස්තුතිපූර්වක ව පසසමි. මේ සියල්ල පුවත්පත්වල පළකර දීමෙන් සහාය වූ "ලංකාදීප" පුවත්පතේ නියෝජ්‍ය කර්තෘ චන්ද්‍රිකා විජේසුන්දර සොයුරියට ත්, "ලක්බිම" කර්තෘ මාණ්ඩලික මහින්ද දළුගොඩආරච්චි සොයුරාට ත් තුති පුදන අතර, මෙය මුද්‍රණද්වාරයෙන් පොත් පිංචක් බවට පත් කළ දේශබන්ධු සිරිසුමන ගොඩගේ සුධීමතුනට පිං පතමි.

සේන නානායක්කාර

# පියවර


| | පිටුව |
|---|---|
| **පිදුම** | 05 |
| **පිවිසුම** | 07 |
| **පියවර** | 09 |
| **සීතල ගඟුල වගෙයි.** | |
| **පූජ්‍ය පල්ලේගම හේමරතන හිමි** | 11 |
| **නෙළුං නෙළුම් - රන්ජිත් රූපසිංහ** | 16 |
| **හතරැස් ලෝකය - අනුර දහනායක** | 22 |
| **මානසික ආතතියෙන් ගොඩ එමු.** | |
| **මහාචාර්ය ඩී.බී. නුගේගොඩ** | 29 |
| **බැන්ද අමුණ - මහින්ද දිසානායක** | 32 |
| **අනුස්මරණය - රත්න බී. ඒකනායක** | 37 |
| **සඳ ගිනිගලක් වූ සඳැ - නිල්මිණි ජයතිලක** | 45 |
| **වැව්ගම් පඬුර - ඒ.පී.බී. ඉලංගසිංහ** | 49 |
| **වීදුරු මැඳුරු - ජානක රාජපක්ෂ හා ලුෂානී අංජනා** | 57 |
| **ඇත්තුරු දඩබිම - මහින්ද දළුගොඩආරච්චි** | 62 |
| **මල්මද ළන්දු - රියන්සි නිහාල්** | 68 |
| **අක්වැස්ස - හරිත විශ්වජිත් මනමේන්ද්‍ර** | 90 |
| **ඉරාදෑමූ කෙටිකතාව - දයාරත්න ඇඹෝගම** | 94 |
| **පහන්සිළයි සඳරැල්ලයි.** | |
| **පූජ්‍ය පොල්හේන්ගොඩ බුද්ධදත්ත හිමි** | 103 |
| **තිත්ත පැටව් නටනවා - ශාන්ත විමලරත්න** | 112 |
| **සඳපළුවෙන් - නන්දා උඩවත්ත** | 118 |
| **මුරගලක විලාපය - නිරෝෂිනී සකුන්තලා පෙරේරා** | 124 |
| **යුද්ධයේ කතාන්දරය - ආචාර්ය ජයන්තලාල් රත්නසේකර** | 129 |
| **සැලළිහිණි වත - පාලිත කේ. විජේසිංහ** | 132 |

# පොතක මහිම

## (ග්‍රන්ථ විචාර සමුච්චය)

ආචාර්ය සේන නානායක්කාර



විද්වත් ලේඛකයෙක් හා
විචාරකයෙක් වන
ආචාර්ය සේන නානායක්කාර
මේ වනවිට ග්‍රන්ථ රාශියක්
ලියා පළකොට ඇත.
ග්‍රන්ථකරණයට අමතරව ඔහු,
වේදිකාව, ටෙලිනාට්‍ය හා
චිත්‍රපට මාධ්‍යයෙහි
ප්‍රවීණ රංගන ශිල්පියෙකි.
මෙය ඔහු ලියූ නවතම කෘතියයි.
මෑතකදී කියැවූ ග්‍රන්ථ රාශියක්
අළලා සකසා ඇති මෙය,
නිර්මාණකරුවාගේ මෙන්ම
විචාරකයාගේ ද
අන්තර් මනෝභාවයන්
සාර්ථකව සැසඳෙන්නා වූ
සෞන්දර්යාත්මක පරිශ්‍රමයකි.
"පොතක මහිම" ළගන්නාසුලු
සුවිශේෂ මාධ්‍ය කාර්යයක් ලෙස
පසසමි.

**මහාචාර්ය
මාපා තිලකරත්න**

RAJMNLIB
99511

250/-
ISBN 978-955-30-3686-5
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
රාජ්‍ය සම්මාන ලත් පොත් ප්‍රකාශකයෝ
661, 665, 675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.
දුරකථනඃ (011) 2685369, 2686925 ෆැක්ස්ඃ 2674187
www.godage.com godageem@slt.lk
9 789553 036865
පිටකවරය කතුවරයා විසිනි